# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## Assignment for Vacation -2020
## ව්‍යාපාර අධ්‍යයනය

Lesson 03

නම / අංකය ...............................................  13 ශ්‍රේණිය

## රජය සහ ව්‍යාපාර

❖ ඕනෑම රටක ආර්ථිකය මෙහෙයවන ප්‍රධාන සංවිධානය වන්නේ එරට රජයයි.

1) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ව්‍යාපාර සඳහා රජය බලපෑම් කරන ප්‍රධාන මට්ටම් සඳහන් කරන්න.
2) ශ්‍රී ලංකා රජය මඟින් විවිධ ස්ථරයන් ඔස්සේ ව්‍යාපාර වලට බලපෑම් කරයි .එසේ බලපෑම් කරන ආකාර නම් කොට ඊට එම ස්ථර ඔස්සේ උදාහරණ සපයන්න.
3) ව්‍යාපාර ආයතනයක් නිවරදි මාර්ගයේ ගමන් කරවීම සඳහා විවිධ සහායන් සහ මඟ පෙන්වීම් සිදු කරනු ලබයි.එවැනි තත්ත්වයන් ව්‍යාපාර ආයතනයකට වැදගත් වන අවස්ථාවන් සඳහන් කරන්න.
4) ශ්‍රී ලංකා රජය තම රටේ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා සිදු කරන බලපෑම් 04 ක් සඳහන් කරන්න.
5) රටක ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යාපාර වලට දායක විය හැකි ආකාර සඳහන් කරන්න.
6) රටක රජයක් විසින් එරට ජනතාව වෙනුවෙන් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන ආර්ථික අරමුණු කවරේදැයි දක්වන්න.
7) රටකට ව්‍යාපාර ඉතා සම්පතකි.ඒනම් රටේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා රජයක් අපේක්ෂා කරන අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර දායක වන බැවිනි. එවැනි දායක වීම් මොනවාදැයි සඳහන් කරන්න.
8) රාජ්‍යයක් සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාර අංශයෙන් සහයෝයෙන් බලාපොරොත්තු වන අතර ව්‍යාපාර විසින් ද එම අරමුණු ඉටු කර ගැනීම සඳහා රජයට විවිධාකාරයෙන් සහයෝගය ලබා දේ.මෙම ප්‍රකාශය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
9) රජය සඳහා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම ඉතා වැදගත් වේ .මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

## <u>ව්‍යාපාර සඳහා බලපාන රජයේ ආර්ථික ප්‍රතිපත්ති .</u>

- රටක ආර්ථික කටයුතු අධ්‍යාපනය කිරීමේදී එය සූක්ෂම, සාර්ව යන පදනම් 02 ක් යටතේ සිදු කරයි.රටක ආර්ථික කටයුතු නිර්මාණය කිරීමේදී මෙම ආකාර 02 පිළිබඳව සලකා බලනු ලැබේ.
- සූක්ෂම ආර්ථික ප්‍රතිපත්ති යටතේ රටක් ඒ ඒ අංශ පිළිබඳව තනි තනිව සලකා බැලීමක් සිදු වේ.එනම් පුද්ගල ආදායම ඉහළ දැමීම ,උපාධිධාරීන්ට රැකියා ලබා දීම,සමෘද්ධිලාභීන්ගේ ආදායම ඉහළ දැමීම ආදිය ඉන් කිහිපයකි.
- සාර්ව ආගමික ප්‍රතිපත්ති යටතේ සමස්ථ ආර්ථිකයම සැලකිල්ලට ගනී.මේ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රථිපත්ති සකස් වන්නේ සාර්ව පදනම මත වැඩි අවධානය යොමු කරමිනි.ඒවැනි අංශ කිහිපයක් නම් ,පොදු මිල මට්ටම් පහත හෙළීම,සේවා නියුක්තිය ඉහළ දැමීම ,රාජ්‍ය වියදම් අඩු කර ගැනීම , පෞද්ගලීකරණය ,සමස්ථ ඵලදායීතාව ඉහළ දැමීම මුදල් සැපයුම තාත්වික කිරීම යනාදියයි.
- මේ අනුව සාර්ව ආර්ථික අංශ කිහිපයකින් වෙන්කොට දැක්විය හැක.ඉන් කිහිපයක් නම්:
  - ✓ ෆිස්කල් ප්‍රතිපත්තිය
  - ✓ මූල්‍ය ප්‍රතිපත්තිය
  - ✓ ආයෝජන ප්‍රතිපතතිය
  - ✓ කර්මාන්ත ප්‍රතිපත්තිය
  - ✓ සේවා නියුක්ති ප්‍රතිපත්තිය
  - ✓ විදේශ ප්‍රතිපත්තිය

10) රජයේ ෆිස්කල් ප්‍රතිපත්තිය යන්න පැහැදිලි කරන්න.

11) ෆිස්කල් ප්‍රතිපත්තිය තුළ දැකිය හැකි රාජ්‍ය ආදායම හා රාජ්‍ය වියදම නිර්වචනය කරන්න.

12) රාජ්‍ය ආදායම වර්ග කොට මේ සඳහා උදාහරණ දක්වන්න.

13) රාජ්‍ය වියදම කොටස් 02 කි.එම කොටස් 02 ක විස්තර කොට දක්වා ඊට උදාහරණ සපයන්න.

14) රජයේ ෆිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාර වලට බලපාන ආකාරය සඳහා උදාහරණ කිහිපයක් දක්වන්න.

15) රජයේ බදු ආදායම සෘජු බදු සහ වක්‍ර බදු ලෙස ප්‍රධාන කොටස් 02 කි මෙහි වෙනස්කම් දක්වන්න.

16) ෆිස්කල් ප්‍රතිපත්තියට අනුව රාජ්‍ය ආදායම රැස් කිරීම සම්බන්ධව ක්‍රියාත්මක ප්‍රධාන ආයතන 04 නම් කරන්න.එම ආයතන රැස් කරන ආදායම් සඳහා උදාහරණ දක්වන්න.

| නීරෝගී ආර්ථික රුධිරය විධිමත් මුදල් සැපයීම ලෙස ප්‍රකාශ කෙරේ. |
|---|

17) රජය විසින් මෙම මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණ නම් කරන්න.

18) රටක රජයක් අනුගමනය කරන සාර්ව ආර්ථික ප්‍රතිපත්තියක් වනුයේ මූල්‍ය ප්‍රතිපත්තියයි.මෙය පැහැදිලි කරන්න.

19) රජය විසින් මුදල් සැපයුම පාලනය කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන උපකරණය නම් කරන්න.

20) නිත්‍ය පහසුකම් අනුපාතියේ ප්‍රධාන කොටස් නම් කරන්න.

21) පොලී අනුපාතිකයේ ප්‍රධාන උපකරණ හඳුන්වා ඒය ව්‍යාපාර වලට බලපාන ආකාරය වෙන වෙනම පැහැදිලි කරන්න.

22) පහත දැක්වෙන්නෙ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන උපකරණ කිහිපයකි.පහත සඳහන් වගුව උපයෝගී කර ගනිමින් ඒම උපකරණ මුදල් සැපයුම වැඩි කිරීම හා අඩු කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දක්වන්න.

| උපකරණය | මුදල් සැපයුම වැඩි කිරීම | මුදල් සැපයුම අඩු කිරීම |
|---|---|---|
| i. සංචිත අවශ්‍යතා | | |
| ii. වට්ටම් අනුපාතය | | |
| iii. විවෘත වෙළඳපොළ | | |
| iv. තෝරාගත් ණය පාලනය | | |

23) මුදල් සැපයුම පාලනය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම සඳහා නිදසුන් 02 ක් ඉදිරිපත් කරන්න.

24) ගුණාත්මක ණය පාලනය යන්න හඳුන්වා ඊට උදාහරණ දක්වන්න.

25) රටක රජයක් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ඒවා ව්‍යාපාරවලට බලපාන ආකාරය සඳහා නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න.

26) දැනට ලෝකයේ ව්‍යාප්ත වෙමින් පවතින කොරෝනා උවදුර අප රටටද විශාල තර්ජනයක් වී ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස සියලු ව්‍යාපාර වසා දමා ඇත.මිනිසුන්ගේ රැකියා නතර වී ඇත. ආදායම් ගලාගෙන ඒමේ මාර්ග අවහිර වී ඇත. එමෙන්ම නිතර නිතර ඇදිරි නිතීය පැනවීම නිසා, මිනිසුන් පරිභෝජනය සඳහා විශාල වශයෙන් පාරිභෝගික භාණ්ඩ අවශ්‍ය බෙහෙත් වර්ග රැස්කරමින් සිටී.

i. මෙවැනි තත්වයක් තුළ මිනිසුන් වාණිජ බැංකු තුළ පවාත්වාගෙන යන තැන්පතු විශාල වශයෙන් මුදා ගැනීමට පෙලඹුනහොත් එම බැංකු වලට ද්‍රවශීලතා ගැටළු සඳහා මුහුණපෑමට සිදුවිය හැකිය. මෙම ප්‍රකාශනය සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වා විස්තර කරන්න.

ii. එවැනි ද්‍රවශීලතා ගැටළු සඳහා වාණිජ බැංකු වලට මුහුණ පෑමට සිදුවුවහොත් ඔවුනට ගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න.

27) රට තුළ පැන නැඟී උද්ධමනකාරී අවස්ථාවක එය පාලනය කිරීම සඳහා ගුණාත්මක ණය සීමා පැනවීම යටතේඑය පාලනය කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග නම් කරන්න.

28)

i. "වැණිජ බැංකු පොලී අනුපාත ඉහළට "මින් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

ii. මෙය වාණිජ බැංකු සහ ව්‍යාපාර වලට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

29) රට තුළ වර්තමානයේ උද්ගත වී ඇති කොරෝනා රෝග ව්‍යාප්තිය සමඟ පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ දැඩි කථාබහක් ඇති වී තිබේ.මෙම පාරිභෝගික ආරක්ෂණය යන්න විස්තර කරන්න.

30) පාරිභෝගික ආරක්ෂණය අතීතයට වඩා මෑත කාලයේ අවශ්‍ය වීමට බලපා ඇති හේතු නම් කරන්න.

31) වෙළෙඳපොළක් තුළ පාරිභෝගික ආරක්ෂණය තහවුරු කිරීම මඟින් පාරිභෝගිකයෙකුට මෙන්ම ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි 2බැගින් සඳහන් කරන්න.

32) වෙළෙඳපොළක් තුළ අන්තර් ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් වර්ග කොට නම් කරන්න.

33) පාරිභෝගිකයෙකුට වෙළෙඳ පොළක් තුළ “හොඳම මිලදී ගැනීමක් ”සඳහා පාරභෝගික වගකීම පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.එම පාරිභෝගික වගකීම් පිළිබඳවද අවබෝධයක් තිබිය යුතුය.එම පාරිභෝගික වගකීම් මොනවාදැයි දක්වන්න.

34) පාරිභෝගිකයෙකුට තම පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා පාරිභෝගික වගකීම් පිළිබඳවද මනා දැනුමකින් හා විමසිල්ලකින් සිටිය යුතුය. පාරිභෝගික වගකීම් යනු පාරිභෝගික අයිතිවාසිකම් කිහිපයක් උදාහරණයට ගෙන ඉහත ප්‍රකාශනයට පක්ෂව අදහස් දක්වන්න.

35) වෙළෙඳ පෙළක් තුළ තාර්කික පාරිභෝගිකයෙකු ලෙස හැසිරීමට නම් ඔබ විසින් ඉටු කළ යුතු කරුණු සඳහන් කරන්න.

36) නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා සම්බන්ධ කරන අතරමැදියන් ලෙස කටයුතු කරන තොග වෙළෙඳුන් සහ සිල්ලර වෙළෙඳුන් විවිධාකාරයේ වෙළෙඳපොළ විෂමාචාර සිදු කරයි.

    i. එවැනි විෂමාචාර මොනවාදැයි සඳහන් කරන්න.
    ii. එවැනි විෂමාචාර වැලැක්වීම සඳහා ඔබට සහ රජයට ගත හැකි ක්‍රියා මාර්ග නම් කරන්න.

37) කොරෝනා රෝගය රට තුළ ව්‍යාප්ත වීමත් සමඟ රට මුහුණු පා ඇති අර්බුදකාරී තත්ත්වය හමුවේ ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස ඔබ පිළිපැදිය යුතු ආචාර්ය ධර්ම නම් කරන්න.

38) L.E.D විදුලි බල්බයක් මිලදී ගැනීම සඳහා වෙළෙඳ පොළට පිවිසි ඔබට එය සීමා සහිත ලසන්ත පෞද්ගලික සමාගමේ රු.420/=ට මිලදී ගත හැකි බවත් පදික වෙ........ එය රු .400/= විය.ඔබ ව්‍යාපාර අධ්‍යනය හැදෑරූ පුද්ගලයෙකු ලෙස මෙම අවස්ථාවේ එම මිලදී ගැනීම සිදු කරන්නේ කවුරුන් මඟින්ද?එම මිලදී ගැනීමට හේතු දක්වන්න.

39) ශ්‍රී ලංකාව තුළ පාරිභෝගික අරක්ෂාව සඳහා ආයතන 04 ක් නම් කරන්න.

40) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන් ව්‍යාපාර වලට වැදගත් වේ. එය ව්‍යාපාර වලට වැදගත් වන ආකාරය දක්වන්න.

41) ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා කෙසේ දායක වන්නේදැයි දක්වන්න.

42) ශ්‍රී ලංකා මහබැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රමාණවත් මුදල් සැපයුමක් පවත්වා ගෙන යාමට උත්සාහ ගැනීමේ අරමුණු 02 ක් සඳහන් කරන්න.

43) යම් ආර්ථිකයකට දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයකට මුහුණ නොදී ඊට ඔරොත්තු දීමේ හැකියාව ............................................යනුවෙන් හඳුන්වයි.

44) ....................................................තුළින් රටක උද්ධමනය පාලනය කිරීම , මිල මට්ටම් ස්ථාවරව පවත්වා ගෙන යාම පොලී අනුපාතය පාලනය කිරීම සිදු කෙරේ.

45) රටක විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම ...........................තුළින් සිදු කෙරේ.

46) රටක සමස්ත නිෂ්පාදිතය ඒම රටෙහි වෙසෙන සමස්ථ ජනතාව අතර සමානව බෙදා හැරීම තුළින් ඒම රටේ.....................................ඇති වේ.

47) රටක් තුළ තත්ත්වයක් ලඟා කර ගැනීම සඳහා ඒම ආර්ථිකය සතු සියළුම .......................................ඵලදායී නිෂ්පාදන කටයුක්තක යොදවා තිබිය යුතුය.

48) ෆිස්කල් ප්‍රතිපත්තියේ අරමුණ ......................................ඇති කර ගැනීමයි.

49) ...........................................මඟින් රජයේ ප්‍රතිපත්තිය පිළිබිඹු වේ.

50) පුද්ගලයින්ගේ හෝ ව්‍යාපාර වලආදායම හෝ වත්කම් මත අයකරන බදු ............................වන අතර භාණ්ඩ හා සේවා මත අය කරන බදු .............................වේ.

51) ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය මඟින් ප්‍රමිත ක්‍රියාත්මක කරන ආකාරයන් දෙකක් වනුයේ .......................................හා ..........................................මඟිනි.

52) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය ආර්ථිකය තුළ ......................................පවත්වා ගෙන යාම හෙවත් .................................යි.

53) ශ්‍රී ලංකා මහ බැංකුව අවසාන ණය දෙන්නා ලෙස සපයන ණය සඳහා අය කරන පොලී අනුපාතිකය ............................................ලෙස හඳුන්වයි.

54) ණය සීමා පැනවීම යටතේ ණය පියවර නිකුත් කිරීමේදී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම ..........................................යටතට ගැනේ.

55) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් විකිණීම හා මිලදී ගැනීමේ කටයුතු ...............................ලෙස හැඳින්වේ.

56) "සහයෝගීතාවය "පාරිභෝගිකයෙකුගේ ..........................................වන අතර පාරිභෝගික අධ්‍යාපනය ලබා ගැනීම ........................................ලෙස සැලකේ.

57) භාණ්ඩයක ඇසුරෙමෙහි සඳහන් භාණ්ඩයේ මිල වෙනස් කර තිබීම ................................. වන අතර ඉන් කඩ වී ඇති පාරිභෝගික අයිතිවාසිකම් වනුයේ ..................................යි.

58) සමාගම් ලාභාංශ බදු ,මුද්දර බදු ,යනාදිය ඒකතු කිරීම .........................මඟින් සිදු කරන අතර විනෝද බදු ,ව්‍යාපාරික ස්ථාන බදු එකතු කිරීම ..........................................මඟින් සිදු කරයි.

59) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ....................................අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වේ.

60) ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය ක්‍රියාත්මක වන්නේ ...............................යටතේය.